Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික/තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණයට අයත් වනසත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017(2018)

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, III ශ්‍රේණියේ වන සත්ත්ව නියාමක තනතුරු පුරප්පාඩු 220ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත කැඳවනු ලැබේ. බඳවා ගනු ලබන සංඛ්‍යාවෙන් 3% ක් කාන්තා අයදුම්කාරියන් සඳහා වෙන් කරනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කාරියන් සංඛ්‍යාවක් සුදුසුකම් නොලදහොත් ඉතිරි සංඛ්‍යාවද පිරිමි අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ. මෙම විභාගය 2018 ජුනි මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. වැටුප් ක්‍රමය :

මාස 06 ක පුහුණු කාලය තුළ පුහුණුවන වනසත්ත්ව නියාමක තනතුර සඳහා රු. 10,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව වන සත්ත්ව නියාමක III තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 27,140- 10 x 300 - 11 x 350- 10 x 495 - 10 x 660 - 45,540 (MN1-2016) වේ.

ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වේ. (උදා : 2018.01.01 දින සිට 2018.12.31 දක්වා රු. 21,532.00 ක මූලික වැටුපක් හා රු. 4,306.00 ක ගැලපුම් දීමනාවක් හිමි වේ.)

02. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :-

(i). වනසත්ත්ව නියාමක තනතුර සඳහා තෝරාගනු ලබන සියළුම දෙනා පුහුණු වන සත්ත්ව නියාමක ලෙස මාස 06ක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර එම කාලය සඳහා දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුව සාර්ථකව අවසන් කරන නිලධාරීන් වනසත්ත්ව නියාමක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

(ii). පුහුණුව සාර්ථකව අවසන් කිරීමට අසමත් වන හෝ පුහුණු කාලය තුලදී සේවය අතහැර යන තැනැත්තෙකුට නැවත මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා හිමිකමක් නොමැත.

(iii). වනසත්ත්ව නියාමක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්විය යුතු වේ. තව ද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(iv). පත්වීම අවු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(v). වන සත්ත්ව නියාමකයන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

(vi). *ගැසට් පත්‍රයේ* 2 ඡේදයෙහි පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරිමේදී අදාල වන පොදු කොන්දේසි අදාල වේ.

(vii). විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. වයස් සීමාව :

ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.03.15 දිනට වයස අවු. 18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.03.15 දිනට හෝ ඊට පෙර හා 1988.03.15 දින හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය මේ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදල නොවේ.)

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

(i). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යෙන් එක් වරකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.

(ii). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබිය යුතු ය.

(iii). වෘත්තීය සුදුසුකම් :

ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම් විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(iv). ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(v). අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(vi). අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(vii). සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(viii). පිරිමි අයදුම්කරුවන් සඳහා උස අඩි 05 යි, අඟල් 04 කට නොඅඩු විය යුතු ය.
කාන්තා අයදුම්කරුවන් සඳහා උස අඩි 05 අඟල් 02කට නොඅඩු විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. ඉහත 04 ඡේදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත පරීක්ෂණයකින් සමත් අයදුම්කරුවන් ලබාගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

ii. බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේ දී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙක් සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

iii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ. :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අමතර අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2. වෘත්තීය සුදුසුකම් | 40 |
| 3. බාලදක්ෂ, පරිසර නියමුහට ශිෂ්‍යභට කණ්ඩායම් නියෝජනය කිරීම | 15 |
| 4. ක්‍රීඩා කුසලතා | 10 |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන දක්ෂතා | 05 |

iv. ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාවය අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපිකව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට අයදුම්කරන ලද සියලු දෙනා හට පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම සිදුවේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams. gov.lk යන වෙබ් අඩවිය හරහා සිදුකරනු ඇත.

v. පුහුණු කාල සීමාව සාර්ථක ලෙස අවසන් කරන අයදුම්කරුවන් පුහුණු කාලසීමාවක් යටතේ වනසත්ත්ව නියාමක III ශ්‍රේණියට වසර 03ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමෙන් පසුව සහ වසර 03ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

06. *විෂය නිර්දේශය :*
ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *කාලය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | පැය 1 | 40% |

අපේක්ෂකයන්ගේ සිතීම, තර්කන හැකියාව, විශ්ලේෂන හැකියාව, හා තීරණ ගැනීමේ හැකියාව හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුත් ප්‍රශ්න පත්‍රයකි.

07. *අයදුම්පත් හා අනෙකුත් විස්තර :*

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය ඊළඟ පිටුවලට ද, ඇතුළත් වන පරිදි සෙ. මී. 21x29 (A4 ප්‍රමාණයේ) කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත සකස් කළ යුතු අතර, අයදුම් පත්‍රය විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තරය අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා තිබේද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වන සත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2017(2018)'' යනුවෙන් සඳහන් කර 2018.03.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග ශාඛාව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය.)

ii. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

iv. අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම්

ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු,රු. 240, 360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතුය.

v. මෙම නිවේදනයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම ඉල්ලුම්පත් ස්වකීය ආයතනය/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vii. ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

08. *විභාග ගාස්තු* :

i. විභාග ගාස්තුව රු. 600.00 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-02-13 යටතේ රාජ්‍ය ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල් ගෙවා ලබාගත් මුදල් භාරගැනීමේ කුවිතාන්සිය/ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කරුණාවෙන් දන්වමි. විභාග ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන 2018.03.15 දිනට පෙර ගෙවිය යුතුය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ලඟ තබා ගැනීම සුදුසුය.)

ii. කුමන කරුණක් යටතේ වුව ද, විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ. විභාග ගාස්තු සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන බවද කාරුණික දන්වමි.

09. පහත සඳහන් ලිපිලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය :

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතිකය
iii. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකයක්, (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව)
iv. චරිත සහතික දෙකක්
v. වෙනත් අදාළ සහතික

***සැළකිය යුතුය.***-ලියකියවිලි/සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම්පත්‍රය සමග එවීම නොකළ යුතුයි.

10.

i. විභාගය මෙහි උපලේඛනය - 1 හි දක්වෙන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවැනි තේරීම වශයෙන් සඳහන් කළ යුතුය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැතිනම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

ii. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.03.15 හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමාසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළග තබාගත් අයදුම්පත්‍රයේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

iv. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව*.- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* .- තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකිය.

13. අවශ්‍ය අවස්ථාවක දී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනජීවී අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජී. ඩී. සූරියබණ්ඩාර,
වනජීවී අධ්‍යක්ෂ ජනරාල්.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අංක 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන ඛණ්ඩ 2 නිලධර ශ්‍රේණියට අයත් වන සත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017 (2018)**

Open Competitive Examination for Recruitment to the Post of Management Assistant-Tech/Non-Tech Seg 2 wildlife Guard of the Wildlife Department - 2017(2018)

විභාගයට පෙනී සිටින නගරය :

| | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න.)

01 විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

02. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා. GUNAWARDHANA M. G. B. S. K.)
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

06.

(i) උපන් දිනය :

අවුරුද්ද [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(ii) 2018.03.15 දිනට වයස :

අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

07. *පුරවැසිභාවය* :

පරම්පරාවෙන් - 1

ලියාපදිංචිවීමෙන් - 2 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

08. ජංගම දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

09. *අධ්‍යාපන සුදුසුකම්* :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

10. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

11. වෘත්තීය සුදුසුකම් :————.

12. (i) විභාග ගාස්තු ගෙවූ තැපැල්/උපතැපැල් කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

| කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න. |
|---|

13. (i) ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

(ii) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :
(i) ආයතනය :————.
(ii) මුල් පත්වීමේ දිනය :————.
(iii) තනතුර :————.
(iv) වැටුප :————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :

(i) :————.

(ii) :————.

16. අයදුම්කරුවන්ගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවට ද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන,
(අත්සන සහතික කරන්නා ඉදිරියේදී අත්සන යෙදිය යුතුය)

දිනය :————.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන —————————— මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2018 —————————— වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බවද, සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————,
ලිපිනය :————,
දිනය :————.

(නිල මුද්‍රාව තබන්න)

18. අයදුම්කරු රජයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ ස්ථිර/ තාවකාලික තනතුරක් දරන බවත්, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව හා අනෙකුත් අදාළ ලේඛන අනුව ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බවද මෙයින් දන්වා සිටිමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පැවරූ
නිලධාරියාගේ අත්සන.

නම :————,
තනතුර :————,
(මුද්‍රාව තබන්න)
දිනය :————.
(අනවශ්‍ය වචන කපා හරින්න)

*සැ. යු.*-ඉල්ලුම් පත්‍රය සමග මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

## උපලේඛනය - I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |